මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධානය 2018 අංක 10 2018 දෙසැම්බර් 03

# ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා උපරිම පොලී අනුපාතය

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 12 (1)(ආ) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා වන උපරිම පොලී අනුපාතය සම්බන්ධයෙන් මෙම විධානයන් නිකුත් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1. | අදාළත්වය හා විෂය පථය | 1.1 | බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාදීමේ දී අසාධාරණ පොලී අනුපාතයන් අය කිරීමෙන් ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීමේ අරමුණ සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා උපරිම පොලී අනුපාතයක් හඳුන්වා දෙනු ලැබේ. |
| | | 1.2 | මෙම විධානය නිකුත් කල දින සිට ප්‍රදානය කරනු ලබන සියළුම ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා මෙම විධානය අදාල වේ. |
| 2. | උපරිම පොලී අනුපාතය | 2.1 | බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා අය කරනු ලබන පොලිය සියළුම අනෙකුත් ගාස්තු ද ඇතුලත්ව වාර්ෂිකව සියයට 35 කට (වාර්ෂික සඵල පොලී අනුපාතය) නොවැඩි විය යුතුය. |
| 3. | ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා අර්ථ දැක්වීම | 3.1 | ක්ෂුද්‍ර ව්‍යවසායයන් පිහිටුවීම සහ කළමනාකරණය සඳහා ලබා දුන් ණය ද ඇතුලත්ව, තනි පුද්ගලයන්ට / කණ්ඩායම් ණය ක්‍රම යටතේ තනි පුද්ගලයන්ට ආදායම් උපදවන ක්‍රියාකාරකම් සඳහා ලබා දුන් ණය |
| 4. | වාර්තා කිරීමේ අවශ්‍යතා | 4.1 | බලපත්‍රලාභී මුදල් සමාගම් විසින්, මූල්‍ය තොරතුරු ජාල පද්ධතියෙහි (FinNet) එන්බීඩී-එම්එෆ්-01-බීඑස්- ශේෂ පත්‍රය යන වාර්තාවෙහි 1.1.4.12.0.0 - ක්ෂුද්‍ර මූල්‍ය ණය යන ක්ෂේත්‍රය යටතේ ක්ෂුද්‍ර මූල්‍ය ණය වාර්තා කළ යුතුය. |
| 5. | අර්ථ නිරූපණයන් | 5.1 | වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 15 ට අඩු සහ සේවක සංඛ්‍යාව 10 ට අඩු නිෂ්පාදන සහ සේවා අංශයෙහි නියුතු ව්‍යාපාර, ක්ෂුද්‍ර ව්‍යවසායයන් ලෙස හැඳින්වේ. (මූලාශ්‍රය : කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය මගින් නිකුත් කල සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති අනුකූලතා රාමුව) |

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**